ලිංගික අපරාධයක් හෝ ලිංගික අපයෝජනයක් හැඳින්වීම සඳහා "දූෂණය" හෝ "කෙළෙසීම" වැනි යෙදුම් යොදාගැනීම මාධ්‍ය තුළ බහුලව දක්නට ලැබේ. නීති පොත් තුළද "දූෂණය" යන යෙදුම තවමත් භාවිතා වෙයි.

සේ නමුත්, "දූෂණය" හෝ "කෙළෙසීම" වැනි යෙදුම් ඔස්සේ ලිංගික අපරාධයකට හෝ ලිංගික අපයෝජනයකට මුහුණ පෑ අය අපවිත්‍ර වී ඇති බවක්, කිලිටි වී ඇති බවක් ගම්‍ය වේ. එය ගර්හාත්මක සමාජ ආකල්පයකට ඉඩ පෑදිය හැකි අතර, ඒ ඔස්සේ ඔවුන් කොන් කිරීමකට ලක්වීමේ ඉඩක් ද තිබේ. "දූෂණය", "කෙළෙසීම" වැනි යෙදුම් භාවිතා කිරීමේ ඇති ගැටළුව එයයි.

එසේ නම්,

1) "දූෂණය", "කෙළෙසීම" වැනි යෙදුම් වෙනුවට, ලිංගික අපරාධය හෝ ලිංගික අපයෝජනය වැනි යෙදුමක් භාවිතා කිරීම වඩාත් උචිත යැයි ඔබ නොසිතන්නේද?

2) "දූෂණය", "කෙළෙසීම" වැනි යෙදුම් වෙනුවට යොදා ගත හැකි වඩාත් යෝග්‍ය යෙදුම් ඔබට යෝජනා කළ හැකිද?